**ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය - 2018**
**--------------------------------------------------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**
**--------------------------------**

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**
**-----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලවඅධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් අධිකාරිය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07 ට පටහැනිව, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒම් ලෙස දැක්විය යුතු පොලී ආදායම් ලැබීම් රු.3,884,687 ක් අඩුවෙන් හා ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත් ආයෝජන ආපසු ගැනීම් හා නැවත ආයෝජනයන්වල මුදල් ගලා යාම් හා ඒම් අතර වෙනස වූ රු.295,637,270 ක් වූ ශුද්ධ අගය ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. තවද ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාම් ලෙස දැක්විය යුතු කෙරීගෙන යන වැඩ රු.61,890,191 ක් සහ ආපදා ණය ලබාදීම් රු.7,832,590 ක් ද, මුදල් ගලා ඒම් ලෙස දැක්විය යුතු ආපදා ණය ආපසු අයකර ගැනීම් රු.5,044,506 ක් ද, දේපල පිරියත උපකරණ හා සේවකයින්ගෙන් ලැබිය යුතු ශේෂ වලට එකතු කර දක්වා තිබුණි. | වර්ෂයට අදාල පොලී ආදායම් රු.128,314,211 ක් වන අතර මුදලින් ලද රු.3,884,687 ක මුදල කාරක ප්‍රග්ධන වෙනස්වීම තුල පෙන්වා ඇත. කෙරීගෙන යන වැඩ සඳහා මුදල් ගලා යාම දේපල පිරියත උපකරණ අත්පත් කරගැනීම් සඳහා මුදල් යෙදවීම් යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල දක්වා ඇත .එමෙන්ම ආපදා ණය ගලා ඒම් හා ගලා යෑම් සේවකයින්ගෙන් ලැබිය යුතු ශේෂ යටතේ දක්වා ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය සැකසීමේදී ප්‍රමිතයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඉකුත් වර්ෂයේ සිදුකර තිබූ රු.48,200,475 ක ආදායම් බදු අධි වෙන්කිරීමක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 හි 36 ඡේදය හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12 හි 80(ආ) ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ බදු වියදමට ගළපනු වෙනුවට පූර්ව වර්ෂ ගැලපුම් ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ බදු පසු ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම්කරණ ප්‍රමිත 08 ට අනුව ආදායම් බදු අධි වෙන්කිරීම 2019 වර්ෂයේදී නිවැරදි කරනු ඇත. | ප්‍රමිතයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 ප්‍රකාරව වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.103,032,087 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති මෝටර් වාහන 26 ක් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. මේ අනුව ගිණුම්කරණ ඇස්තමේන්තුවල පවතින දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 අනුව ප්‍රතිශෝධනය කර සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ප්‍රමිත අංක 16 හි 29 වන වගන්තිය ප්‍රකාරව වත්කම් පිරිවැයට පෙන්නුම් කිරීම ආයතනයේ ප්‍රතිපත්තියයි. වාහන ප්‍රත්‍යාගණනය 2018 දී ආරම්භ කර ඇතිමුත් වර්ෂය අවසානය වන විට වාහන 02 ක තක්සේරු වටිනාකම් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලැබී නොතිබුණි. එම නිසා ප්‍රත්‍යාගණනය කල වාහන වල ප්‍රත්‍යාගනිත අගය හා ඉහත වාහන 02 සම්බන්ධයෙන් ගිණුම් උපලේඛන (3) හි හෙලිදරව් කර ඇත. | ප්‍රමිතයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37 ට පටහැනිව අසම්භාව්‍ය වගකීම් සඳහා සත්‍ය ඇස්තමේන්තුව නිශ්චිතව හඳුනා ගැනීමකින් තොරව කම්කරු වන්දි වශයෙන් රු.5,800,000 ක් ප්‍රතිපාදනය කර තිබුණි. | අධිකාරියේ නීති නිලධාරී විසින් ලබා දී ඇති ලිඛිත තහවුරුව පදනම් කොටගෙන අසම්භාව්‍ය වගකීම් සඳහා වෙන්කිරීම් සිදු කොට ඇත . | ප්‍රමිතයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව සෑම වර්ෂයකදීම දේපල පිරියත හා උපකරණ හා අස්පෘශ්‍ය වත්කම්වල ඉදිරියට ගෙන යා යුතු වටිනාකම සමාලෝචනය කර ගිණුම්වලට ගැලපිය යුතු වුවත් එසේ සමාලෝචනය කිරීමකින් තොරව දේපල පිරියත හා උපකරණ, ලැබිය යුතු ශේෂ, තැන්පතු හා අත්තිකාරම් සහ වෙනත් වත්කම් සඳහා එකතුව රු.5,976,657 ක හානි කරන අලාභ සඳහා ගැලපීම් කර තිබුණි. | දේපළ, පිරියත හා උපකරණ අස්පෘෂ්‍ය වත්කම්වල හානිකරණ අලාභ සම්බන්ධයෙන් තොරතුරු 2018 වර්ෂයේදී වාර්තා වී නොමැති බැවින් එම ශේෂයන් ගිණුම්වල පෙන්වා ඇත. | ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව කටයුතු කළ යුතුය. |

### 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 අප්‍රේල් 01 දිනෙන් පසු අදාල නොවන, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 61 වගන්තිය ප්‍රකාර රු.22,364,664 ක අතිරේක බදු වියදමක් ආදායම් බදු වියදම් යටතේ දක්වා තිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ලාභය අඩුවෙන්ද බදු වගකීම වැඩියෙන්ද දක්වා තිබුණි. | 2017 අංක 24 දරණ නව දේශීය ආදායම් බදු පනත 2018.04.01 දිනෙන් පසුව එළඹෙන ගිණුම් කාලපරිච්ඡේදයට අදාල වන බැවින් 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 61 වගන්තිය ප්‍රකාරව රු.22,364,664 බදු වියදමක් ලෙස දක්වා ඇත. ඉදිරියේදී නිවැරදි ආදායම් බද්ද ගිණුමවල ගැලපීමට කටයුතු කරනු ඇත. | නිවැරදිව ආදායම් බදු ගනණය කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත | | | |
| | (i) 15(1) වගන්තිය | මැණික් කර්මාන්තය කරගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ බලධාරියා වන අධිකාරිය විසින් කිසිඳු බලපත්‍රයක් රහිතව මැණික් ගැරීමේ ව්‍යාපෘති 3 ක් ක්‍රියාත්මක කරමින් පැවතුණි. | මෙවැනි ව්‍යාපෘතිවලදී පාර්ශව අතර ඇතිකර ගත් ගිවිසුම මූලික කරගෙන ව්‍යාපෘති කටයුතු සිදුකරගෙන යාම ව සිදුවී ඇත. එහිදී අදාළ ගිවිසුම සඳහා නෛතික වලංගුභාවයක් පවතින බැවින් එය බලපත්‍රයක් ලෙස සලකා කටයුතු කර ඇත.<br>1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 18.2 වගන්තිය ප්‍රකාරව රජය සතු ඉඩමක පතල් කැණීමේ සහ මැණික් ගැරීමේ අයිතිවාසිකම වෙන්දේසියකින් නොවන වෙනත් ආකාරයකට වුවද අත්කරගත හැකි බව පිළිගෙන ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii)15(2) වගන්තිය | මැණික් පරීක්ෂා කිරීම හා සහතික නිකුත් කිරීම සඳහා පවත්වාගෙන යන පෞද්ගලික රසායනාගාර ලියාපදිංචි කිරීමට හා නියාමනය කිරීමට ක්‍රමවේද සකස් කර නොතිබුණි. | බලපත්‍ර රහිතව පවත්වාගෙන යන රසායනාගාර නියාමනය සඳහා රසායනාගාර ලියාපදිංචි කිරීමට ක්‍රමවේදයන් හා නිර්නායකයන් සකස් කර ඇත. ලියාපදිංචි කළයුතු ආකාරය හා ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් කඩිනමින් නිතිමය පියවර ගැනීමට නියමිතය. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය<br>-------------------- | | | |
| (i) 6.5.1 ඡේදය | අධිකාරියේ 2018 වර්ෂයේ මූල්‍ය වාර්තා විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2019 මාර්තු 26 දිනදීය. | කෙටුම්පත් වාර්ෂික වාර්තාව සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීම ප්‍රමාද වීම මත වාර්ෂික වාර්තා බාරදීම ප්‍රමාද විය. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (ii) 6.5.3 ඡේදය | 2016, 2017 වර්ෂවල වාර්ෂික වාර්තා විගණිත දිනය වූ 2019 මැයි 15 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2016 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට සූදානම් කොට ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (ඇ) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය<br>------------------ | | | |
| (i) 2 ඡේදය | සභාපතිවරයා වෙත නිල වාහනයක් ලබාදීම වෙනුවට සභාපතිවරයාගේ පෞද්ගලික වාහනය රාජකාරී සඳහා භාවිතා කිරීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත මාසයකට රු.200,000 බැගින් 2018 මැයි සිට මාස 08 ක කාලයක් සඳහා රු.1,600,000 ක මුදලක් ගෙවා තිබුණි. මීට අමතරව අධිකාරියේ සංචිත වාහනයක්ද සභාපතිවරයාගේ රාජකාරී සඳහා යොදවා 2018 ජුනි සිට දෙසැම්බර් දක්වා කිමී.12,838 ක් ධාවනය කර තිබූ අතර එහි ධාවන සටහන්වල භාවිත කල නිලධාරියා අත්සන් කර නොතිබුණි. | සභාපතිගේ රාජකාරි ගමන් වෙනුවෙන් අධිකාරියේ වාහනයක් ලබාදීමට නොහැකි තත්වය මත මිල ගනන් කැඳවා කුලි පදනම මත වාහනයක් ලබාගැනීමට කටයුතු කල අතර වාහන වල තත්ත්වය හා මිල ගනන් සැලකීමේදී ඉදිරිපත් වූ මිල රු.200,000 කට අධික විය. අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි මාසිකව රු.200,000 ක මුදලක් සභාපති භාවිතා කරන ඔහුගේ පෞද්ගලික රථය වෙනුවෙන් ගෙවන ලදී. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) 3.2 ඡේදය | සභාපතිවරයාට 2018 අගෝස්තු 31 සිට මාස 4 ක කාලය තුල සැපයූ අතිරේක ඉන්ධන සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය රහිතව රු.256,857 ක් ගෙවා තිබුණු අතර අනෙකුත් නිලධාරීන් සඳහා වර්ෂය තුල අවස්ථා 22 කදී සැපයූ අතිරේක ඉන්ධන සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය රහිතව රු.241,409 ක් ගෙවා තිබුණි. | සභාපතිට නියමිත ඉන්ධන සීමාව ඉක්මවා යාමට සිදුවූ රාජකාරි ගමන් සඳහා අමතර ඉන්ධන දීමනා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතියට ඉදිරිපත් කර ඇත. වාහන හිමි අධ්‍යක්ෂකවරුන්ගේ අමතර ඉන්ධන දීමනා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව ප්‍රතිපූර්ණය කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (ඇ) | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2013 නොවැම්බර් 01 දිනැති අංක DMS/Policy/03 දරන ලිපිය | අනුමත තනතුරු 32 ක් සඳහා නව බඳවා ගැනීමේ පරිපාටි සංශෝධනය කර අනුමත කරගෙන නොතිබුණි. | බඳවා ගැනීමේ පරිපාටි සංශෝධනය කිරීමට කඩිනමින් කටයුතු කෙරේ. | බඳවා ගැනීමේ පරිපාටි සංශෝධනය කර අනුමත කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2017 දෙසැම්බර් 26 දිනැති අංක DMS/1629/Vol II දරන ලිපිය | අනියම් ක්ෂේත්‍ර සහකාරවරුන් ස්ථිර කිරීම භාණ්ඩාගාරය ප්‍රතික්ෂේප කර තිබුණද, ක්‍රියාකාරී මට්ටමේ නොතිබූ මැණික් ගැරීමේ ව්‍යාපෘතිවලට අනුයුක්ත කර සිටි අනියම් ක්ෂේත්‍ර සහායකයින් 15 ක් ස්ථිර කර තිබුණි. | ක්ෂේත්‍ර සහයක තනතුරු 15 ක් සඳහා අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන පරිදි නව බඳවා ගැනීම් සිදු කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා දී ඇත. අදාල බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව අභ්‍යන්තර අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ මණ්ඩල නිර්දේශ යටතේ බඳවා ගැනීම් සිදුකරන ලදි. | භාණ්ඩාගාරද පදෙස් ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

-------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.91,794,389 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.113,338,005 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.21,585,116 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පරිපාලන වියදම් රු.18,742,306 කින්ද, සේවක වියදම් රු7,459,785 කින් සහ ප්‍රවර්ධන වියදම් රු.68,718,971 කින් අඩු වුවද ආදායම රු.48,434,206 කින්ද වෙනත් ආදායම් රු.26,581,296 කින්ද මූල්‍ය ආදායම් රු.2,195,190 කින් අඩුවීම සහ ආදායම් බදු වියදම රු.39,253,984 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය විසින් මැණික් ගැරුම් ව්‍යාපෘති හා විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සහ පනතින් පැවරී ඇති බලතල ප්‍රකාරව මැණික් ගල්, ඉල්ලම් හා මැණික් ඉඩම් වෙන්දේසි සිදුකිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු නොකරන අතර ඒ සඳහා වෙනත් මාර්ගෝපදේශයක් අනුමත කරගෙන ද නොතිබුණි. | විශේෂ ව්‍යාපෘති සඳහා මාර්ගෝපදේශයක් සකස්කරනු ලැබූ අතර ඉදිරි සියළුම ව්යාපෘතීන් අදාල මාර්ගෝපදේශයන්ට අනුව සිදු කරනු ඇත. | මාර්ගෝපදේශ සකස්කර අනුමත කරගැනීමට හා අනුගමනය කිරීමට කටයුතු කල යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පනත මගින් අධිකාරිය වෙත පැවරුණු ස්වර්ණාභරණ කර්මාන්තය නියාමනය සඳහා ස්වර්ණාභරණ කර්මාන්තකරුවන් ලියාපදිංචි කරවීම, ලියාපදිංචිය අලුත් කිරීම හා පසු විපරම් කිරීම සඳහා අධිකාරියේ මැදිහත් වීම අවම මට්ටමක විය. | ස්වරණාභරණ කර්මාන්ත ලියාපදිංචි කිරීම සහ ලියාපදිංචිය ලබා නොගත් අලෙවිසැල් වැටලීම් සිදුකර ඇති අතර ස්වර්ණාභරණ අලෙවිසැල් ලියාපදිංචිය වැඩි වී තිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | ජලජීවී වගා සංවර්ධන අධිකාරියට අයත් උඩවලව මිරිදිය මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයේ ඉල්ලම් ඉවත් කර ගැනීම සඳහා එම අධිකාරිය සහ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය අතර ඇති කරගෙන තිබූ ගිවිසුමට පටහැනිව හා ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ හා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතියක් නොමැතිව අධිකාරිය විසින් ව්‍යවසායකයෙකු සමඟ එළඹි ගිවිසුමක් මත එකී භූමිය හාරා මැණික් ගැරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. ව්‍යාපෘතියෙන් ලැබුණු මැණික් වර්ග සහ ප්‍රමාණ පිළිබඳව ගැරුම් අවස්ථාවේ තබා ඇති සටහන් සහ මැණික් තක්සේරුවේදී තබා ඇති සටහන් අතර දැඩි විෂමතාවක් පැවතුණ අතර තක්සේරු කමිටුව විසින් ඉවත් කල ක්‍රාත් 88.65 ක් වූ මැණික් ගල්වල වර්ගය, කැබලි සංඛ්‍යාව ඉවත් කල ආකාරය, ඉවත්කිරීමට හේතු හා අනුමැතිය දක්වා නොතිබුණි. | ඉඩම් හිමි පාර්ශ්වයේ එකඟතාවය 2018.01.05 දින ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ පැවති හමුවේදී ලැබී ඇත. අදාල භූමියේ මැණික් ඉල්ලම් ඉවත් කර ගැනීම සඳහා අධිකාරිය සහ ජලජීවී වගා සංවර්ධන අධිකාරිය සමඟ අත්සන් තබන ලද ගිවිසුමේ දක්වා ඇත. මාස 03 ක කාලයක් සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වන අවසරය 2018.02.12 දින අත්සන් කර තිබූ ගිවිසුම මගින් අධිකාරිය වෙත ලැබී තිබුණි. | අදාල අනුමැතින් ලබාගත යුතු අතර ව්‍යාපෘති කටයුතු නිසි පරිදි වාර්තා කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කැළණි ගඟ ආශ්‍රිතව අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන හද්දුවවත්ත මැණික් ගැරුම් ව්‍යාපෘතිය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා අදාල ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. ව්‍යාපෘතිය හේතුවෙන් ගඟේ ඉවුරු දැඩි ලෙස ඛාදනයට ලක් වී තිබුණද ඒවා යථාවත් කිරීම සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ව්‍යවසායකයාගෙන් ඇප මුදල් ලබාගෙන ද නොතිබුණි. ව්‍යාපෘතියෙන් ලැබුණු මැණික් ගල් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 4 කදී වෙන්දේසි කිරීම සඳහා තක්සේරු කිරීමේදී බර ක්‍රාත් 1,858.65 ක් වූ මැණික් ගල් වටිනාකමක් නොමැති ගල් ලෙස සඳහන් කර ඉවත් කර තිබූ අතර එම ගල් වර්ග, කැබලි සංඛ්‍යාව, ඉවත් කිරීමට හේතු හා ඉවත් කල ආකාරය සහ අනුමැතිය වාර්තා කර නොතිබුණි. | ව්‍යාපෘතිය සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිර්දේශ නොලැබීම මත පරිසර නිර්දේශ ලබානොදී ඇති බව නිරීක්ෂණය වේ. අධිකාරි පනතේ විධිවිධානවලට අනුව විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් පත්කරනු ලබන කමිටුවක අධීක්ෂණය යටතේ අධිකාරිය විසින් අනවසර මැණික් ගැරීම්වලට ලක්වන ස්ථානවල පවතින මැණික් සම්පත ක්‍රමවත් පරිදි ඉවත්කර ගැනීම යන එකඟතාව මත ව්‍යාපෘතිය කරගෙන ගිය බව දන්වා සිටින අතර එමඟින් මිලියන 65 ක වෙන්දේසි ආදායමක් ඉපයීමට සමත් වී ඇත. | අදාල අනුමැති ලබා ගැනීමට සහ මැණික් ගල් ඉවත් කිරීම සම්බන්යෙන් වාර්තා තබා ගැනීමට පියවර ගත යුතුය. |
| (ඈ) | අධිකාරියේ අපනයන අලෙවි සහ ප්‍රවර්ධන කටයුතු සම්බන්ධයෙන් වූ ප්‍රවර්ධන සැලැස්ම ප්‍රකාරව රු.28,000,000 ක් වැයකර පැවැත්වීමට සැලසුම් කර තිබූ දේශීය ප්‍රදර්ශන 3 ක් සහ විදේශ ප්‍රදර්ශන 3 ක් පවත්වා නොතිබූ අතර රු.3,690,000 ක් වැයකර සැලැස්මෙහි ඇතුලත් නොවූ විදේශීය ප්‍රදර්ශන 3 ක් පවත්වා තිබුණි. විදේශීය ප්‍රදර්ශන සඳහා අපනයනකරුවන් සහභාගී කර ගැනීමට හා දායකත්වය ලබා ගැනීමට ප්‍රමාණවත් වැඩපිළිවෙලක් නොවීම හේතුවෙන් ප්‍රදර්ශන 2 කට අදාල රු.2,815,000 ක සම්පූර්ණ වියදම හා ප්‍රදර්ශන 4 කට අදාලව අපනයනකරුවන් ලබා දිය යුතු රු.3,426,163 ක දායකත්වය අධිකාරියෙන් දරා තිබුණි. | එක් දේශීය ප්‍රදර්ශනයක් සඳහා ඇස්තමේන්තු ගත මුදල ප්‍රදර්ශනයක් සඳහා උපයෝජනය කරන ලදි. විශාල වියදමක් වැයවන බැවින් දේශීය ප්‍රදර්ශනයක් සංවිධානය නොකරන ලදි. එක් විදේශ ප්‍රදර්ශනයක් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ ඉල්ලීම මත සංවිධානය කරන ලද අතර තවත් ප්‍රදර්ශනයක් අපනයන සංවර්ධන මණ්ඩලය සංවිධානය කරන ලදි. තවත් විදේශ ප්‍රදර්ශනයක සංවිධායක ආයතනය ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ සම්බන්ධීකරණය සහ ප්‍රවර්ධන කටයුතු පමණක් සිදු කරන ලදි.<br><br>ප්‍රදර්ශන සඳහා අයකරන වෙළඳ කුටි ගාස්තුව ඉතා ඉහළ බැවින් අපනයනකරුවන් සහභාගී විය නොහැකි බව දන්වා සිටීම නිසා ශ්‍රී ලංකා මණ්ඩප ප්‍රවර්ධනයට අධිකාරිය වියදම් දැරිය යුතු විය. මුළු වියදම ආවරනය කර ගත නොහැකි බැවින් අපනයන කරුවන්ගෙන් අපේක්ෂා කල දායකත්වය ලබා ගත නොහැකි විය. | සැලසුම් ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

**3.3 මතභේදයට තුඩුදුන් ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සප්ත වාර්ෂික නිවාඩු ලැබූ විශ්ව විද්‍යාල ආචාර්යවරයෙකු වූ අධිකාරියේ සභාපතිවරයා විශ්ව විද්‍යාලයෙන් සම්පූර්ණ වැටුප් හා දීමනා ලබමින් සිටියදී අධිකාරියෙන් ද එම සම්පූර්ණ වැටුප හා දීමනා ලබාගෙන තිබුණි. | 2017 නොවැම්බර් 24 දින අමාත්‍යමණ්ඩල පත්‍රිකාව සඳහා ලබාදී ඇති නිර්දේශ ප්‍රකාරව අධිකාරිය විසින් හිටපු සභාපතිවරයා වෙත මොරටුව විශ්ව විද්‍යාලය විසින් වැටුප් හා දීමනා ලෙස මාසිකව ගෙවනු ලබන මුදලද ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සභාපතිවරයා සඳහා හිමිවන දීමනාද ගෙවීම් කර ඇති අතර අප අධිකාරිය විසින් වැඩිපුර ගෙවීමක් සිදුකර නොමැත. | වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගත යුතුය |
| (ආ) | සභාපතිවරයාට ආයතනයේ සභාපති ධූරය හෙබවීම වෙනුවෙන් 2017 ජූනි 17 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 03/2015 ප්‍රකාරව හිමිවන රු.100,000 ක මාසික දීමනාවක් 2015 මැයි 25 දිනැති අංක 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව රු.19,890 ක ඉන්ධන දීමනාවක් පමණක් හිමි වේ. ඒ අනුව 2017 දෙසැම්බර් සිට 2018 අප්‍රේල් දක්වා රු.542,657 ක් වැඩිපුර ගෙවා තිබුණි. | | |

**3.4 අරමුදල් ඌන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්වර්ණාභරණ කර්මාන්තකරුවන්ගෙන් රු.5,000 ක වාර්ෂික ලියාපදිංචි ගාස්තුවක් අයකර 2008 වර්ෂයේ ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල පිහිටුවා තිබුණි. ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබූ අතර අරමුදලේ අරමුණු නිශ්චිතව දක්වා නොතිබුණි. | අදාල අරමුදල 2006 වර්ෂයේ අයවැය යෝජනා මත පිහිටුවා ඇති අතර එම යෝජනා ප්‍රකාරව ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා අදාල අරමුදල උපයෝජන කිරීමට සැලසුම් කර ඇත. | අරමුදල සඳහා අනුමැතිය ලබා ගත යුතු අතර අරමුණු නිශ්චිතව දැක්විය යුතුය. |
| (ආ) | කර්මාන්තයේ සංවර්ධනය වෙනුවෙන් අරමුදල භාවිතා කිරීමට නිශ්චිත සැලැස්මක් හෝ ක්‍රමවේදයක් නොවූ අතර 2018 දෙසැම්බර් 31 දිනට රු.72,131,745 ක අරමුදල් ශේෂය නිෂ්කාර්යව තබා තිබුණි. | අදාල අරමුදල උපයෝජනය සඳහා 2017 වර්ෂයේ විශේෂ සැලසුම් සකස් කරනු ලැබ ක්‍රියාත්මක කර ඇත. | නිශ්චිත සැලැස්මක් මත අරමුදල උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2017 හා 2018 වර්ෂවලදී අරමුදල භාවිත කර රු.4,213,289 ක උපකරණ හා වත්කම් ස්වර්ණාභරණ සංගමයක් වෙත පරිත්‍යාග කර තිබුණද, ඒවා ඌන උපයෝජිතව පැවතීමෙන් උපකරණ ලබාදීමේ අරමුණු ඉටුවී නොතිබුණි. තවද, අරමුදල භාවිත කර සිදුකල පරිත්‍යාග වලින් කර්මාන්තය සඳහා වූ දායකත්වය අවම මට්ටමක පැවතුණි. | ස්වර්ණාභරණ කර්මාන්තයට තාක්ෂණික සහාය ලබාදීම වෙනුවෙන් සංගමය සඳහා ආභරණ නිෂ්පාදනයට අවශ්‍ය මූලික උපකරණ සහ ඒවාට අවශ්‍ය වෙනත් පහසුකම්ද ලබාදී ඇති අතර සංගමයේ සාමාජිකයන් එම පහසුකම් උපයෝගී කරගෙන ආභරණ නිෂ්පාදනය 2018 මැයි සිට ආරම්භ කර ඇත. | වත්කම් උපයෝජනය සම්බන්ධව පසු විපරම් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2012 වර්ෂයේ රු.8,950,000 කට මිලදී ගත් මෝටර් රථයක් 2017 දෙසැම්බර් දක්වා කි.මී.105,502 ක් පමණක් ධාවනය කර වර්ෂයකට අධික කාලයක් නිෂ්කාර්යව තබා තිබුණි. වාහනය භාවිත කල වර්ෂ 6 ක කාලය තුල රු.4,542,832 ක් වැයකර අලුත්වැඩියාවන් 55 ක් සිදුකර තිබුණි. | සිදුකල අළුත්වැඩියා අතුරින් බොහෝමයක් රථයක් ධාවනයේදී අත්‍යාවශ්‍යයෙන්ම සිදුකල යුතු අළුත්වැඩියාවන් වන අතර නියෝජිත ආයතනයේ නිර්දේශය මත සිදුකර ඇත. | වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කටුනායක ගුවන් තොටුපල පිටවීම් පර්යන්තයේ ස්ථාපිත අපනයන සේවා මධ්‍යස්ථානයේ අපනයනිත මැණික් හා ස්වර්ණාභරණ පාර්සල් මුද්‍රා තැබීම සඳහා රු.1,242,000 ක් වැයකර මිලදී ගත් පොලිතීන් බෑග් 10,000 කින් 9,740 ක් හා ආරක්ෂිත පටි සහ ස්ටිකර් 40,000 කින් 39,740 ක් වර්ෂයකට වැඩි කාලයක් තිස්සේ නිෂ්කාර්යව තබා තිබූ අතර අපනයන මධ්‍යස්ථානය වසා දමා තිබුණි. | නිසි ඇගයීමක් නොකර විශාල අපනයන පාර්සල් ඇසුරුම් ප්‍රමාණයක් මිලදී ගැනීමට සම්බන්ධ සියළුම නිළධාරීන්ගෙන් නිදහසට කරුණු විමසා ඇත. මෙම ඇසුරුම් කඩිනමින් භාවිතා කිරීමට අවස්ථාව සලසාදීමට හැකියාව පවතී. | වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | රු.මිලියන 13.6 කට අධික වියදමක් දරා 2017 වර්ෂයේ ස්ථාපිත කර තිබූ ජංගම රසායනාගාරයෙන් 2018 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා මාස 10 ක කාලය තුල සහතිකපත් 425 ක් නිකුත් කර රු.380,180 ක් උපයා තිබුණි. ඊට අදාල ඍජු වියදම රු.641,352 ක් හා ක්ෂය වෙන් කිරීම රු.2,844,609 ක් වීමෙන් සමස්ථ ඌණතාවය රු.3,105,823 ක් වී තිබුණි. මෙම ජංගම රසායනාගාරය සඳහා 2016 වර්ෂයේ මිලදී ගත් රු.99,395 ක් වූ පරිගණකයක් හා රු.7,794,888 ක් වූ Energy Dispersine X Ray Fluorescence Spectrometer උපකරණ 2 ක් වර්ෂ 2 කට වැඩි කාලයක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව තබා තිබුණි. | දැනට බාල ප්‍රමිතියෙන් යුතු ස්වර්ණාභරණ වෙළඳපලෙහි සංසරණය වන බැවින් වැටලීම් කණ්ඩායම් යොදා ඒවා පරීක්ෂා කිරීමට යෝජනා වී තිබුණි. එවැනි අවස්ථාවලදි ක්ෂේත්‍රයේ ස්වර්ණාභරණ පරීක්ෂා කිරීම සඳහා Hand Held Type EDXRF යන්ත්‍ර සුදුසු බැවින් එම යන්ත්‍ර 2 ක් මිලදී ගෙන තිබුණි. එම උපකරණ මගින් පරීක්ෂා කිරීම සඳහා නිලධාරීන් යෙදවීම අපහසුව ඇත. | වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | අධිකාරිය සතු මාතර බෙලිදෙණිය ප්‍රදේශයේ පිහිටි වටිනාකම රු.889,000 ක් වූ පර්චස් 80 ක ඉඩමක් හා එහි පිහිටි ලියාපදිංචි අගය රු.3,091,861 ක් වූ වර්ග අඩි 3,007 ක ගොඩනැගිල්ලක් 2012 වසරේ සිට වසර 7 කට වැඩි කාලයක් නිෂ්කාර්යව තබා තිබුණි. | මෙම ගොඩනැගිල්ල උපයෝජනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවතී. | පවතින ගොඩනැගිල්ල උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | රත්නපුර ප්‍රාදේශීය කාර්යාලයේ පිහිටුවීමට යෝජිත කෞතුකාගාරයක් වෙනුවෙන් 2016 වර්ෂයේ මිලදීගත් රු.1,251,498 ක් වූ වත්කම් වර්ෂ 2 කට වැඩි කාලයක් තිස්සේ නිෂ්කාර්යව තබා තිබූ අතර විගණිත දින තෙක් කෞතුකාගාරය ආරම්භ කර නොතිබුණි. | සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ උපදෙස් පරිදි මෙහි ඉදිකිරීමේ කටයුතු ආරම්භ කලද කැමරා පද්ධතිය, විදුලිබල්බ සවිකිරීමේ ප්‍රමාදය මත කෞතුකාගාරය විවෘත කිරීමේ කටයුතු ප්‍රමාද විය. | අදාල ඉදිකිරීම නිමකර උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.6 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළුගහ හැරනියාවක මැණික් ගැරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 12.5 කට ව්‍යවසායකයෙකු 2017 අගෝස්තු 11 දින තෝරාගෙන තිබුණද එම ස්ථානයේ මැණික් ගැරීම සඳහා පරිසර නිර්දේශය සහ අනිකුත් රාජ්‍ය ආයතන වෙතින් ලබාගත යුතු අනුමැතීන් ලබා ගැනීමට අසමත් වීම හේතුවෙන් ව්‍යාපෘතිය විගණිත දින තෙක් ආරම්භ කර නොතිබුණි. | ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබුවේ අනවසර මැණික් ගැරීම් වැළැක්වීමේ පියවරක් ලෙසයි. එහිදී 1993 අංක 50 දරණ ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරී පනතේ 14 (ඊ)(උ) සහ 14(ඒ) වගන්ති මූලිකව සහ අදාල පනතේ මූල්‍ය පරමාර්ථවලට අනුකූල වන ලෙසින් අධිකාරිය මත පැවරී ඇති වගකීම්වලට අනුව එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රථම අදාල නිර්දේශයන් ලබාගැනීමට අපේක්ෂා කෙරේ. | ව්‍යාපෘති කාල ප්‍රමාද රහිතව ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 2018 සැප්තැම්බර් 10 නිම කිරීමට නියමිතව පැවති ඇහැළියගොඩ කාර්යාල ගොඩනැගිල්ලේ ඉදිකිරීම් විගණිත දිනය වූ 2019 මැයි 15 තෙක් නිමකර නොතිබුණු අතර ඉදිකිරීම් කාලය, විවිධ හේතූන් මත මාස 4 ½ කින් හා කිසිදු හේතුවක් හෝ අනුමැතියක්ද රහිතව මාස 4 කින් ද දීර්ඝ කර තිබුණි. | මේ වනවිට 2019.05.26 දක්වා කාලය දීර්ඝ කිරීම් ලබා දී ඇත. මෙම ගොඩනැගිල්ල සැලසුම් කිරීමේදී හදිසි පිටවීම් තරප්පුපෙළ සහිත ගෘහනිර්මාණ සැලසුම්පත විධිමත්ව සකස් කර අදාල ආයතනවලින් අනුමත කලද ඉදිකිරීම් ආරම්භ කිරීමේදී මෙම සැලසුම සම්බන්ධයෙන් මහජනතාවගෙන් පැමිණි දැඩි විරෝධය නිසා අදාල සැලසුම් පත් සංශෝධනය කිරීමට සිදු වූ අතර කාලය දීර්ඝ කිරීම් හා ගෙවීම් ගිවිසුම් ප්‍රකාරව සිදු කර ඇත. | ව්‍යාපෘති කාල ප්‍රමාද රහිතව ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. |

## 3.7 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2 ට හා අයවැයට අනුකූලව පිළියෙල කර නොතිබූ අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. | 2018 වර්ෂය සඳහා වන ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය අනුව අනුමත අයවැය ලේඛනය ප්‍රතිපාදනයන්ට අනුකූලව සකස් කර ඇත. | නියමිත පරිදි ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර අනුමත කරගත යුතුය. |
| (ආ) | 2018 ප්‍රසම්පාදන සැලැස්ම අනුව ඉටුකල යුතු ප්‍රධාන කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම, කතරගම නිවාඩු නිකේතනයක් ඉදිකිරීම හා ජාත්‍යන්තර මට්ටමේ මැණික් රසායනාගාරයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම යන කාර්යයන් වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 640 ක් රු.මිලියන 35 ක් හා රු.මිලියන 150 ක් වෙන්කර තිබුණද ඊට අදාල කිසිදු කාර්යයක් විගණිත දින තෙක් ආරම්භ කර නොතිබුණි. රත්නපුර දෙමුවාවක මැණික් වීදිය ජාත්‍යන්තර මැණික් මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට රු.මිලියන 100 ක් වෙන්කර තිබුණද අදාලව ඉඩම් පවරා ගැනීම නිමකර සැලැස්ම ප්‍රකාර කාර්ය ආරම්භ කර නොතිබුණි. | අධිකාරියේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය විධිමත් අනුමැතීන් ඉදිරියේදී ලබා ගැනීමට කටයුතු කරනු ඇත.<br>මෙයට අදාල අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව 2017.11.30 දින අනුමැතියට යොමුකර ඇති අතර එහි තීරණ මේ වන තෙක් අධිකාරිය වෙත ලැබී නොමැත. ඉදිරියේදී ලැබීමට නියමිත අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව මෙහි ඉදිරි කටුයුතු සිදුකිරීමට කටයුතු කරන අතර 2017.07.31 දින ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමට අනුමැතිය ලබාදී ඇත. | ප්‍රාග්ධන ව්‍යාපෘති කාල ප්‍රමාද රහිතව ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | මැණික් ගැරුම් ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව තෝරාගත් ආරක්ෂක සේවය ලබා නොගෙන හද්දුවවත්ත සහ බගවන්තලාව ව්‍යාපෘති සඳහා වෙනත් ආයතනයකින් ආරක්ෂක සේවාව ලබාගෙන පිළිවෙලින් මාස 8 ක් සඳහා රු.3,526,038 ක් ද, ගිවිසුමකට එළඹීමකින් ද තොරව මාස 16 ක් සඳහා රු.1,375,000 ක්ද ගෙවා තිබුණි. | ආරක්ෂක සේවා සැපයූ ආයතන සමග ගිවිසුම් අත්සන් කිරීමේ ප්‍රමාද වීමක් සිදු වී ඇති බව පිළිගන්නා අතර ඉදිරියේදී ගිවිසුම්ගතව පමණක් ආරක්ෂක සේවා ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි. | ගිවිසුම් වලට එළඹීමට කටයුතු කල යුතුයි. |

**3.8 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුරප්පාඩුව පැවති විධායක ශ්‍රේණිවල තනතුරු 04 ක රාජකාරී ආවරණය කිරීම සඳහා වෙනත් නිලධාරීන් පත්කර තිබූ අතර ඒ සඳහා ස්ථිර නිලධාරීන් බඳවාගෙන නොතිබුණි. | අධ්‍යක්ෂ (අපනයන සේවා හා අපනයන අලෙවි) තනතුර සඳහා දෙවරක් සම්මුඛ පරීක්ෂණ පැවැත්වුවද තේරී පත්වූ අයදුම්කරුවන් පත්වීම් භාරගැනීම ප්‍රතික්ෂේප කර ඇත. අධ්‍යක්ෂ (ඉඩම්, කැණීම් හා පරිසර) වැඩ තහනමට ලක්ව තිබීම මත රාජකාරී ඉටු කිරීම සඳහා නිළධාරියෙකු පත්කර තිබේ. සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුර පිරවීම සඳහා කළමනාකරණ සේවා අනුමැතිය නොලැබීමෙන් එම තනතුර පුරප්පාඩුව පවතින අතර සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණයෙන් තේරී පත්වූ නිළධාරිණිය සම්බන්ධව විනය කටයුත්තක් හේතුවෙන් පත්වීම් ලබාදීම ප්‍රමාද කර ඇත. | පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුයි. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියේ ප්‍රධාන අරමුණු වූ රන් ආනයනකරුවන් සඳහා පහසුකම් සැලසීම, ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ හුවමාරුව සඳහා පහසුකම් සැලසීම හා ප්‍රවර්ධනය, රත්නදීප වෙළඳකුටිය මෙහෙයවීම හා කළමනාකරණය යන කාර්යයන් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීමට හා එකී අරමුණු ඉටු කිරීමට ක්‍රියාකර නොතිබුණි. | අධිකාරියේ ප්‍රධාන අරමුණ වන අපනයනය කිරීම සඳහා පහසුකම් සැලසීම සඳහා දැනට ක්‍රියාත්මක වන NBT 2% බදු මුදල ඉවත් කිරීමට මැදිහත් කරුවකු වශයෙන් මුදල් අමාත්‍යාංශ එකඟතාවය ලබා ගැනීමට කටයුතු කර ඇත. ප්‍රති අපනයන සඳහා ගෙන එනු ලබන රළු මැණික් සඳහා පහසුකම් සැලසීම සිදුකර ඇති නමුත් එමගින් මූල්‍ය වියදම් හා ආදායම් ජනනය නොවන බැවින් ක්‍රියාකාරී සැලැස්මේ දක්වා නොතිබුණි.<br>මැණික් සහ ස්වර්ණාභරණ ප්‍රවර්ධනය සඳහා WTC වෙළඳ පහසුකම් සලසාදීම සිදුකර ඇත. | ප්‍රධාන අරමුණු ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීමට සහ එම අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වර්ෂය තුල ඉටුකල යුතුව තිබූ පරිසර සංරක්ෂණ වැඩසටහන් පැවැත්වීම, මැණික් හා ස්වර්ණාභරණ ප්‍රවර්ධනය හා ප්‍රති අපනයනය යටතේ විදේශීය රටවල් සම්බන්ධ කරගෙන ඉටුකල යුතු ක්‍රියාකාරකම් 5 ක්, මැණික් වෙළඳපලක් පිහිටුවීම, ප්‍රධාන කාර්යාලයේ පිහිටි රසායනාගාරය හා තක්සේරු රසායනාගාරය උසස් කිරීම, මහනුවර නව රසායනාගාර 2 ක් පිහිටුවීම, අධිකාරිය සඳහා ISO ප්‍රමිති සහතිකයත්, ස්වර්ණාභරණ තක්සේරු අංශය සඳහා ජාත්‍යන්තර සාමාජිකත්වය හා ජාත්‍යන්තර සහතිකයත් ලබා ගැනීම, මැණික් හා ස්වර්ණාභරණ සඳහා අන්තර්ජාල වෙන්දේසි ක්‍රමය හඳුන්වාදීම යන කාර්යයන් සඳහා රු.326,938,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද එම කාර්යයන් වර්ෂය තුල ඉටුකර නොතිබුණි. | වර්ෂය තුල ඉටුකල යුතුව තිබූ කාර්යයන් සඳහා අවශ්‍ය සැලසුම් සැකසීම වාර්ෂික වාර්ථා සැකසීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතින් ලබා සිදුකර ඇති අතර 2019 වර්ෂය තුළ අදාල අරමුණ ලඟාකර ගැනීමට අපේක්ෂා කෙරේ. | ක්‍රියාකාරී සැලැස්ම ප්‍රායෝගික විය යුතු අතර එහි ඉලක්ක ළඟා කර ගැනීමට ආයතනය කටයුතු කල යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අයවැය මගින් මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ නියැලි කර්මාන්තකරුවන් ඇගයීම සඳහා රු.10,000,000 ක් ප්‍රතිපාදනය කරගෙන ක්‍රියාකාරී සැලැස්මටද ඇතුලත් කර තිබුණද එය උපයෝජනය නොකර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින්ද තොරව කර්මාන්තයේ නියැලී ව්‍යාපාරිකයන්ගෙන් රු.15,850,000 ක දායක මුදලක් ලබාගෙන අධිකාරියේ රජත ජයන්ති උත්සවයද සමඟ කර්මාන්තකරුවන් ඇගයීමේ සම්මාන උළෙලක් සංවිධානය කර තිබුණි. උත්සවය 2018 නොවැම්බර් 23 දින පවත්වා තිබුණද අදාල අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව සඳහා 2018 දෙසැම්බර් 14 දින ආවරණ අනුමැතිය ලබාදී තිබුණි. රජත ජයන්ති සම්මාන උළෙල සඳහා සියලු භාණ්ඩ හා සේවා මිලදී ගැනීම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.4(ආ) ට පටහැනිව වෙළඳපල මිල සැසඳුම් ක්‍රමය යටතේ ලබාගෙන තිබුණි. සම්මාන උළෙල සඳහා අවශ්‍ය ප්‍රමාණයට වැඩියෙන් කුසලාන 21 ක් සකස් කරගෙන තිබූ අතර ඉන් රු.183,600 ක් වූ කුසලාන 17 ක් නිශ්කාර්යව තබා තිබුණි. | මෙම කාර්යය සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබුනද සභාපතිතුමා විසින් අධිකාරියේ මූල්‍ය තත්වය මත කර්මාන්තකරුවන්ගේ සහයෝගයෙන් කිරීමට තීරණය කරන ලදි. මේ සඳහා මූල්‍ය අනුග්‍රාහක දායකත්වය සැපයීමට කර්මාන්තකරුවන් එකඟවිය. අනතුරුව 2018.10.02 දින අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව තොරතුරු පත්‍රිකාවක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීමට ඉදිරිපත් කරන ලදි. මෙහි ත්‍යාග ප්‍රදානය සඳහා සම්මාන 80 ක්ද අතිගරු ජනාධිපතිතුමා සඳහා එක් සම්මාණයක්ද ලෙස සම්මාන 81 නිෂ්පාදනය සඳහා ඉල්ලීමක් ලබාදෙන ලදි. එහෙත්, පසුගිය සභාපතිවරුන් 23 ක් සඳහාද සම්මාණ ප්‍රදානය කරන ලෙසද දැනුම්දෙන ලද අතර ඒ අනුව අදාල ඉල්ලීම 100 දක්වා වැඩිකරන ලදි. මේ අතර පැවති අස්ථාවර දේශපාලන වාතාවරණය හේතුවෙන් පසුගිය සභාපතිවරුන් සඳහා සම්මාණ ප්‍රදානය කිරීම වැඩසටහන් පෙළගැස්මට ඇතුලත් නොකරන ලදි. | අයවැය ප්‍රකාරව, නියමිත අනුමැතීන් හා විධිවිධානවලට අනුකූලව කටයුතු කල යුතුය. |

## 4.2 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතුව පවතින අතර අධිකාරිය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් දැනුවත්වී තිබුණද ඊට අදාල කිසිදු කාර්යයක් සමාලෝචිත වර්ෂය තුල ඉටුකර නොතිබුණි. | මෙම කරුණ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කර අධිකාරිය ක්‍රියාත්මක කල තිරසර සංවර්ධනය එක්සත් ජාතීන්ගේ න්‍යාය පත්‍රයට අදාල කරගනිමින් ඉටුකිරීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. | අදාල අරමුණු හා ඉලක්ක හඳුනා ගැනීමට කටයුතු කල යුතුය. |